# කාර්ය සාධන වාර්තාව -2010

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

**කොලොන්නාව.**

# 2010 වර්ෂය සඳහා වන රජයේ කර්මාන්තශාලා කාර්ය සාධන වාර්තාව

## 1.0 හැඳින්වීම

1.1 රජයේ කර්මාන්තශාලාවේ මෙහෙවර වනුයේ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, උපදේශන සේවා සහ ආධුනිකයින්, ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන්, උපාධි අපේක්ෂක ආධුනිකයින් හා යාන්ත්‍රික ඉංජිනේරුවරුන් සඳහා කර්මාන්ත ශාලා වැඩහල නිෂ්පාදන සහ වැඩ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබාදීම යනාදී වැඩ සහ සේවාවන් සැපයීමයි

1.2 රජයේ කර්මාන්තශාලාවෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන්

නිෂ්පාදන හා නඩත්තු වැඩහල් සඳහා වන මෙහෙයුම්

කාර්ය මණ්ඩලයයේ සහ පුහුණුවන්නන් සඳහා වන මානව සම්පත් සංවර්ධනය

නිෂ්පාදිතයන් සහ නඩත්තු සේවා සඳහා වන විධිවිධාන

අමුද්‍රව්‍ය, ආයුධ හා උපකරණ සඳහා වන ප්‍රසම්පාදන කටයුතු

1.3 ව්‍යාපාරික අත්තිකාරම් ගිණුම් දෙකක් පවත්වාගෙන යාම - ඉහත සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කළ වැඩ අත්තිකාරම් ගිණුම හා ගබඩා අත්තිකාරම් ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

1.4 රජයේ කර්මාන්තශාලාව විසින් තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිශ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන් වන්නේ.

- ආරෝග්‍යශාලා ගෘහ උපකරණ හා මෙවලම් නිශ්පාදනය කිරීම
- ජල කළමනාකරණය සඳහා වන වාත්තු යකඩමය නිශ්පාදන අරිය දොරටු, දච්ගුලු දොරටු හා පත් දොරටු
- වාත්තු යකඩමය නිශ්පාදනයන් (මැන්හෝල් සැකිලි හා පියන් - ජල කළමනාකරණ උපකරණ)
- ලී භාණ්ඩ හා අනෙකුත් ලී නිශ්පාදිතයන්
- මාර්ග බාධක හා සංඥා පුවරු
- යාන්ත්‍රික සයිරන් නලා, වර්ෂ, මාස හා දින කොටස් ඇතුළත් තැපැල් මුද්‍රා

- ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ,   දැන්වීම් පුවරු, කැටයම් වැඩ සහ ඒහා බැඳුනු සේවාවන් සහ එම්බොස් (ඉලුප්පුම්වැඩ)

- පවුඩර් කෝටින් සහ යාන්ත්‍රික පින්තාරු වැඩ

- සියලූ ආකාරයේ පාටිෂන් (වෙන් කිරීම්)වැඩ, ඇලූමිනියම් දොරවල් හා ජනෙල් නිෂ්පාදනය්

- බිත්ති  පනේල (කැටයම්) කිරීම හා

- කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වැල්ඩින් වැඩ සහ කම්මල් වැඩ

- විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලූ පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ

- යන්ත්‍රෝපකරණ සවිකිරීම

- යන්ත්‍රෝපකරණ අලූත්වැඩියා කටයුතු හා සේවා සැපයීම් කටයුතු

- මොටර් රථ වාහන අලූත්වැඩියාව හා සේවා සැපයීම්

- විදුලි යාන්ත්‍රික වැඩ

- විදුලි ස්ථාපනයන් හා අළුත් වැඩියාවන්

- ඉලෙක්ට්‍රො ප්ලෙටින් ( විද්‍යුත් ලෝහාලේපනය)

# 2.0 මානව සම්පත් දත්ත 2010

## 2.1 අනුමත කාර්යය මණ්ඩලය, පුරප්පාඩු හා අතිරික්ත

| තනතුර | අදාලවන සේවාය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | ස්ථිර | අනියම්/ කොන්ත්‍රාත් | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | |
| කර්මාන්තශාලීය ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ. | 13 | 12 | - | 1 | - |
| නියෝජ්‍ය කර්මාන්තශාලීය ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ. | | | - | | - |
| කළමනාකරු -වැඩ | ශ්‍රී.ලං.ඉ.සේ. | | | - | | - |
| කළමනාකරු - කාර්ය සම්පාදන | ශ්‍රී.ලං.ඉ.සේ. | | | - | | - |
| කළමනාකරු -අලවි | ශ්‍රී.ලං.ඉ.සේ. | | | - | | - |
| නියෝජ්‍ය කළමනාකරුවෝ | ශ්‍රී.ලං.ඉ.සේ. | | | - | | - |
| නියෝජ්‍ය කළමනාකරු(පාලන) | ශ්‍රී.ලං.පරි.සේ. | 1 | 1 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1 | 1 | - | - | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ගණ.සේ. | 2 | 2 | - | - | - |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව** | | **17** | **16** | | **1** | - |
| **තෘතීක මට්ටම** | | | | | | |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 5 | 5 | - | - | - |
| ප්‍රධාන සැලසුම් ශිල්පි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 1 | | | 1 | |
| පරිපාලන නිළධාරී | රා.කළ.සහකාර (අධි පන්තිය) | 1 | 1 | - | - | - |
| **තෘතීක මට්ටම එකතුව** | | **7** | **6** | - | 1 | - |
| **ද්වීතීක මට්ටම** | | | | | | |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා | 1 | 1 | - | - | - |
| මානව සම්පත් සහකාර | උපාධිධාරී | 2 | 2 | - | - | - |
| ප්‍රගති හා සංවර්ධන සහකාර | උපාධිධාරී | 1 | 1 | - | | - |
| මූල්‍ය හා පිරිවැය සහකාර | උපාධිධාරී | 3 | 3 | - | - | - |
| අලෙවි හා සැපයුම් සහකාර | උපාධිධාරී | 1 | 1 | - | | - |
| නීති සහකාර | උපාධිධාරී | 1 | 1 | - | - | - |
| යාන්ත්‍රික අධිකාරී | ශ්‍රී.ලං.තා.සේ. | 19 | 14 | - | 5 | - |

| තනතුර | අදාලවන සේවාය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | ස්ථිර | අනියම්/ කොන්ත්‍රාත් | | |
| **ද්විතික මට්ටම** | | | | | | |
| සැලසුම් ශිල්පි | ශ්‍රී.ලං.තා.සේ. | 4 | 4 | - | - | - |
| රාජ්‍ය කල. සහකාර | රා.කළ.සේ. | 55 | 44 | - | 11 | - |
| වැඩහල සහකාර/ වැඩහල ලිපිකරු | දෙපාර්තමේන්තු ගත | 34 | 27 | - | 7 | - |
| කාලසඝණක ලිපිකරු | දෙපාර්තමේන්තු ගත | 9 | 9 | - | - | - |
| සුබසාධක නිළධාරි | දෙපාර්තමේන්තු ගත | 1 | - | - | 1 | - |
| වැඩ පරිපාලක | දෙපාර්තමේන්තු ගත | 32 | 30 | - | 2 | - |
| ආරක්ෂක නිළධාරි | ආශ්‍රිත සේවා | 1 | 1 | - | - | - |
| **ද්විතික මට්ටම එකතුව** | | **164** | **138** | **-** | **26** | **-** |
| **ප්‍රාථමික මට්ටම** | | | | | | |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 14 | 15 | - | - | 1 |
| කාර්යාල කාර්ය සේවය | කාර්යාල කාර්ය සහකාර | 16 | 9 | - | 7 | - |
| සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තු ගත | 9 | 6 | - | 3 | - |
| ආරක්ෂක නියාමක | දෙපාර්තමේන්තු ගත | 421 | 2 | - | | - |
| කම්කරු ( I - I පන්තිය) | දෙපාර්තමේන්තු ගත | | 248 | - | 97 | - |
| කම්කරු ( I - II පන්තිය) | දෙපාර්තමේන්තු ගත | | | - | | - |
| කම්කරු ශිල්පීය නොවන | දෙපාර්තමේන්තු ගත | | 74 | - | | - |
| | | | | | | - |
| **ප්‍රාථමික මට්ටමේ එකතුව** | | **460** | **354** | **-** | **107** | **01** |
| **මුළු එකතුව** | | **648** | **514** | **-** | **135** | **01** |

## 3.0 2010 මූල්‍ය වර්ෂය සඳහා වන වැය විස්තරය

### 3.1

1 වන ව්‍යාපෘතිය - **සාමාන්‍ය පාලනය හා කාර්ය මණ්ඩල සේවාවන්**

**2** වන ව්‍යාපෘතිය - **නිපැයුම්, පිරිසැකසුම්, නඩත්තු හා අලුත්වැඩියා සේවාවන්**

| පුනරාවර්තන වියදම් | ව්‍යාපෘති 01(රු.මි) | ව්‍යාපෘති 02 (රු.මි) |
|---|---|---|
| පුද්ගල වැටුප් | 16.2 | 20.7 |
| වෙනත් වියදම් | 7.3 | - |
| **උප එකතුව** | **23.5** | **20.7** |
| මූලධන වියදම් | 11.7 | 15.7 |
| **මුළු එකතුව** | **35.2** | **36.5** |

### 3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් B ගිණුම

| විස්තරය | ඇස්තමේන්තුව අනුව (රු.මි.) | සත්‍ය අගය (රු.මි.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **32.00** | **23.22** |
| අවම බැර සීමාව | **18.00** | **22.84** |
| උපරිම හර ශේෂ සීමාව | **117.00** | **94.89** |

### 3.3. කල වැඩ අත්තිකාරම් ගිණුම

2010 වසර සඳහා වන පිරිවැටුම රු. 371,813,790.64 වන අතර ශුද්ධ ලාභය රු. 86,213,983.64 ක් වූ අතර මෙය පිරිවැටුමෙන් 23.19% ක් පමණ විය.

### 3.4 ගබඩා අත්තිකාරම් ගිණුම

වර්ෂය තුළ දී සැපයීම්හි වටිනාකම රු105,801,409.54 ක් වූ අතර මුරෙ 501(අ) ප්‍රකාරව ගබඩා අත්තිකාරම් පාඩු අපේක්ෂා නොකරනු ලබන්නාසේම ලාභ අපේක්ෂාවෙන් ද කටයුතු නොකරේ.

## 4.0 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

### 4.1 අවසන් කල ව්‍යාපෘති හා වැඩ-2010 වර්ෂය

| අංකය | ව්‍යාපෘති | ඇස්තමේන්තු මුදල (රු: මි. ) | පිරිවැය (රු:මි) |
|---|---|---|---|
| 1. | පුළුගුනාවි වාරි ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම - ගේට්ටු ගලවා නව ස්ථානයක සවිකිරීම. | 10.21 | 6.64 |
| 2. | පුළුගුනාවි ව්‍යාපෘතිය සඳහා සොරොව් දොරටු සාදා සවි කිරීම. | 2.72 | 1.25 |
| 3. | කංකානියාකුලම් සාම ව්‍යාපෘතිය සඳහා අරිය දොරටු 04 ක් සාදා සවිකිරීම. | 31.99 | 22.03 |
| 4. | යෝධ වැව ව්‍යාපෘතිය සඳහා ගේට්ටු සෑදීම | 1.63 | 0.86 |
| 5. | නාවක්කුලි බරාජය සඳහා ත්‍රැෂ් රැක් 84 ක් සාදා සවි කිරීම. | 14.13 | 3.43 |
| 6. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සඳහා 2010 නිදහස් දින උළෙලට හිරු ආවරණ සෑදීම. | 6.12 | 5.31 |
| 7. | මොරවැව වාරි ව්‍යාපෘතිය සඳහා හදිසි දොරටු සාදා සවිකිරීම සහ ඔසවන යාන්ත්‍රණය ප්‍රතිස්ථාපනය කිරීම. | 3.45 | 3.45 |
| 8. | පොතුවිල් අධිකරණය සඳහා ලිපිගොනු රාක්ක සෑදීම. | 1.17 | 0.89 |
| 9. | නාවක්කුලි ව්‍යාපෘතිය සඳහා ලී ගේට්ටු සෑදීම. | 5.17 | 4.67 |
| 10. | නුවරඑළිය දිසා අධිකරණය සඳහා ලී රාමු සහිත රාක්ක සෑදීම. | 1.77 | 1.74 |
| 11. | නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණය සඳහා ලී රාමු සහිත රාක්ක සෑදීම. | 1.37 | 1.00 |
| 12. | නාවක්කුලි ව්‍යාපෘතිය - (අ) ජල පාලන දොරටු 42 ක් සාදා සවිකිරීම. (ආ) පැසරලය සඳහා අත්වැටක් සෑදීම. | 45.81 | 42.90 |
| 13. | මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා ඡන්ද පෙට්ටි සෑදීම. | 15.13 | 14.68 |
| 14. | වහළ සෑදීම - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 7.46 | 5.97 |
| 15. | කන්තලේ වැවේ මොන්ටානා සොරොව්ව සඳහා හදිසි දොරටු සෑදීම සහ සවිකිරීම. | 6.71 | 4.02 |
| 16. | යාපහුව රජමහාවිහාරය වටා අඩි 100 වැටක් සහ දොරටු 02 ක් සෑදීම. | 3.49 | 2.22 |

## 4.2 2010 වර්ෂයේ ආරම්භ කර, 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩ

| අංකය | ව්‍යාපෘති | ඇස්තමේන්තු මුදල (රු: මි. ) |
|---|---|---|
| 1. | තොන්ඩමනාරු බරාජයේ අතිරේක ගේට්ටු සඳහා ලෑලි එලක සෑදීම සහ සවිකිරීම. | 8.87 |
| 2. | රඹකැන් ඔය ව්‍යාපෘතිය සඳහා සොරොව් දොරටු සාදා සවිකිරීම. | 18.24 |
| 3. | දැදුරු ඔය ව්‍යාපෘතිය සඳහා සොරොව් දොරටු සාදා සවිකිරීම. | 35.83 |
| 4. | ඇල්ලපතාන ව්‍යාපෘතියේ වාරි දොරටු සෑදීම. | 56.46 |
| 5. | තොන්ඩ බරාජය සඳහා ත්‍රෑෂ් රැක් 72 ක් සාදා සවිකිරීම. | 12.11 |
| 6. | රඹකැන් ඔය ව්‍යාපෘතිය සඳහා අරිය දොරටු 01 ක් සාදා සවිකිරීම. | 70.66 |
| 7. | දැදුරුඔය වාරි ව්‍යාපෘතිය සඳහා අරිය දොරටු සැලසුම්කර සාදා සවිකිරීම. | 402.36 |
| 8. | නෛතික සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා දැව භාණ්ඩ සෑදීම | 1.17 |
| 9. | තැපැල් දෙපාර්තමේන්තුව සඳහා වර්ෂ කැට 200 ක් සෑදීම. | 1.63 |
| 10. | පොලිස් දෙපාර්තමේන්තුව සඳහා අංක තහඩු 3500 ක් සෑදීම. | 3.05 |
| 11. | ආරක්ෂක අමාත්‍යාංශය සඳහා තට්ටු දෙකේ ඇඳන් 2200 ක් සෑදීම. | 16.96 |

## 4.3. විශේෂ සේවාවන්

ජාතික නිදහස් දින උළලේ ආචාර පියීකාව හා විශේෂ අමුත්තන් සඳහා වන කුටිය සුදානම් කිරීම, විදේශීය රාජ්‍ය නායකයින් හා විදේශීය නිලධාරින් පිළිගැනීම සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ විශේෂ පියීකාව හා පැමිණීමේ පර්යන්තය නිර්මාණය කිරීම සහ මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා ජන්ද පෙට්ටි සුදානම් කිරීම.

## 5.0 පුහුණුවීම

### 5.1 පහත සඳහන් ආකාරයෙන් රජයේ කර්මාන්තශාලාව විසින් පුහුණුවන්නන්, ඩිප්ලෝමා සිසුන්, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සහ ඉංජිනේරුවනට පුහුණු කිරීම් ලබා දෙනු ලැබීය

| | සේවය | සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|
| 1 | තාක්ෂණික / විද්‍යාලයීය පුහුණුවන්නන් | 6 | මාස 6 - අවුරුදු 03 |
| 2 | ශ්‍රී ලංකා ඉංජිනේරු විද්‍යාලයීය ඉංජිනේරුවන් | 5 | මාස 6 |

### 5.2 අභ්‍යන්තරික කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් විශේෂ පුහුණුවීම්

| | සේවය | වැඩසටහන | ආයතනය | සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|---|---|
| 1 | යාන්ත්‍රික ඉංජිනේරු | කථනය පිළිබඳ වැඩසටහන | ඉංජිනේරු ආයතනය | 1 | දවස් 10 |
| 2 | | RPL ක්‍රමය මගින් NVQ ප්‍රධානය කිරීම සඳහා තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | MCESHCA | 2 | දවස් 05 |
| 3 | | සික්ස් සිග්මා | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 2 | දවස් 02 |
| 4 | | ව්‍යාපෘති යෝජනා ලිවීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 1 | දවස් 05 |
| 5 | | ඉදිකිරීම් යන්ත්‍ර යාන්ත්‍රික කරණය මගින් ඉදිකරීම් කළමණාකරණය | ජපානය | 1 | මාස 03 |
| 6 | ගණකාධිකාරි | වානිජවේදී පශ්චාත් උපාධි වැඩසටහන | කැලණිය විශ්ව විද්‍යාලය | 1 | අවුරුදු02 |
| 7 | යාන්ත්‍රික අධිකාරි | RPL ක්‍රමය මගින් NVQ ප්‍රධානය කිරීම සඳහා තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | MCESHCA | 4 | දවස් 05 |
| 8 | | මිණුම් ලබාගැනීමේ සම්මත ක්‍රම ගොඩනැගිලි කාර්යයන් සඳහා | ඉදිකිරීම් පුහුණු සංවර්ධන ආයතනය | 1 | දවස් 01 |
| 9 | | තත්ව කළමනාකරණ ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 1 | දවස් 38 |
| 10 | උපාධිධාරි | විනය කටයුතු ක්‍රියා පරිපාටිය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 1 | දවස් 03 |
| 11 | | සන්නිවේදනය නිපුණතා ඩිප්ලෝමාව (විධායක ශ්‍රේණියේ නොවන) | INGAF | 1 | පැය 200 |
| 12 | | දමිළ භාෂා පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 1 | පැය 108 |
| 13 | | අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 02 |
| 14 | | උසස් පරිගණක පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 3 | දවස් 05 |

| | විස්තරය | වැඩසටහන | ආයතනය | සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|---|---|
| 15 | | උසස් පරිගණක පුහුණුව - මයික්‍රොසොෆ්ට් එක්සෙල් | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 03 |
| 16 | උපාධිධාරී | දමිළ භාෂා පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 1 | පැය 108 |
| 17 | | ව්‍යාපෘති කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 1 | දවස් 03 |
| 18 | | ලේඛණ කළමනාකරණය | ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව | 2 | දවස් 05 |
| 19 | | රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 3 | අවුරුදු01 |
| 20 | | කාර්යාල කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 3 | දවස් 05 |
| 21 | | යහපාලනය සහ මානව සම්පත් කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 11 | දවස් 05 |
| 22 | | රාජ්‍ය මුදල් කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 5 | දවස් 05 |
| 23 | | ගබඩාකරණය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 6 | දවස් 03 |
| 24 | | විනය කටයුතු ක්‍රියා පරිපාටිය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 10 | දවස් 03 |
| 25 | | ව්‍යාපෘති කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 03 |
| 26 | | රජයේ ඉඩම් කළමනාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 03 |
| 27 | | විශ්‍රාම වැටුප් කටයුතු | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 6 | දවස් 02 |
| 28 | | අභ්‍යන්තර සහ බාහිර විගණනය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 5 | දවස් 02 |
| 29 | කළමනාකරණ සහකාර | අත්තිකාරම් ගිණුම් | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 15 | දවස් 01 |
| 30 | | රාජ්‍ය සේවයේ ඵලදායිතාවය සහ තත්වය ඉහළ නැංවීම | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 6 | දවස් 01 |
| 31 | | මූලික පරිගණක පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 3 | දවස් 05 |
| 32 | | උසස් පරිගණක පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 05 |
| 33 | | උසස් පරිගණක පුහුණුව- මයික්‍රොසොෆ්ට් එක්සෙල් | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 03 |
| 34 | | උසස් පරිගණක පුහුණුව- මයික්‍රොසොෆ්ට් පවර් පොයින්ට් | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 3 | දවස් 02 |
| 35 | | උසස් පරිගණක පුහුණුව- මයික්‍රොසොෆ්ට් ඇක්සස් | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 6 | දවස් 04 |
| 36 | | විද්‍යුත් තැපැල සහ අන්තර්ගතය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2 | දවස් 01 |
| 37 | | ඉංග්‍රිසි භාෂා පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 6 | පැය 108 |
| 38 | | ලේඛණ කළමනාකරණය | ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව | 13 | දවස් 05 |
| 39 | | සික්ස් සිග්මා | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 1 | දවස් 02 |
| 40 | රියදුරු | රියදුරු පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 3 | දවස් 02 |

# 06. බාධාවන්

## 6.1 මූල්‍යමය බාධාවන්

නව තාක්ෂණය සහිත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සහ වැඩහල් ගොඩනැගිලි නඩත්තුව සඳහා ප්‍රමානවත් මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් නිෂ්පාදන ඵලදායීතාවයට බලපෑමක් ඇති විය.මෙම තත්වය මගහරවා ගැනීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමානවත් ප්‍රතිසම්පාදන සපයාගත යුතු යි.

ඇස්තමේන්තු කරන ලද කාර්යයන් සඳහා අමුද්‍රව්‍ය වෙළඳපොලෙහි ඇති වූ මිළ ඉහල යාම් හේතුවෙන් අවාසිදායක තත්ත්වයක් නිර්මාණය විය.මෙම තත්ත්වය වාරි මර්ග ව්‍යාපෘති සඳහා වන ජල කළමණාකරණ වානේ ගේට්ටු නිෂ්පාදනයේ දී හා සවිකිරීම කෙරෙහි ද අයහපත් ආකාරයෙන් බලපෑවේය.

## 6.2 පාලනමය බාධාවන්

ප්‍රධාන ගණකාධිකාරී නියෝජ්‍ය කලමනාකරු(පරිපාලන) හා අනෙකුත් ප්‍රධාන තනතුරු පුරප්පාඩු නොපිරවීමේ හේතුවෙන් දැඩි කළමනාකරණමය දුර්වලතා ඇතිවීමට හේතු වී තිබෙයි. මේ සම්බන්ධයෙන් වන ඉල්ලීම් කීපවරක්ම වගකිව යුතු ආයතනයන් වෙතින් ඉල්ලා සිටිය ද සඵලදායී පිළිතුරක් නොලද හෙයින් පෙර සඳහන් ඇබෑර්තු තව දුරටත් පිරවිය යුතු තත්ත්වයේම පවතී.

නිපැයුම්, වැඩ හා සේවාවන් සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියේ පවත්නා ඍජු මාර්ගෝපදේශනය අනුගමනය කිරිමේදී යම් ප්‍රමාදයන් ඇති වනු ලැබීම හේතුවෙන් සේවාදායකයන් සමග ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව ඇතැම් වැඩ නිමකොට භාර දිය නොහැකි වෙයි. මේ හේතුවෙන් රජයේ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් ඇතැම් සේවාදායකයින් තුළ පැවැති විශ්වාසය බිඳවැටිය හැකි අතර මෙම තත්ත්වය වර්තමාන වෙළඳපළේ පවතින තරගකාරි ස්වභාවයේ දී ආයතනයට අවාසිදායක ලෙස බලපෑ හැක.

# 7.0 වර්තමාන තත්වය 2016 ජුනි 15

*1.* 2015 වර්ෂයේ බලාපොරොත්තු වූ පිරිවැටුම් ඉලක්කය රුපියල් මිලියන 610.00ක් වුවද, කළ වැඩ අත්තිකාරම් ගිණුමේ පිරිවැටුම රු.මි. 383 ක් වන අතර වියදම රු.මි. 378.8 ක් විය. ඒ අනුව අතිරික්තය රු.මි 4.28 විය. පාලනය කල නොහැකි පහත සදහන් ගැටළු හේතුවෙන් වර්ෂයේ පිරිවැටුම් අඩු වී ඇත.

(අ) ගණුදෙනුකරුවන්ගේ ඉලක්ක සැපයීමේදී ප්‍රසම්පාදන රෙගුලාසි වලට අනුව භාණ්ඩ හා අමුද්‍රව්‍ය සපයා ගැනීමට කාලයක් ගතවන බැවින් 2015 වර්ෂයේ සම්පූර්ණ කරන ලද සහ කරගෙන යමින් පැවති ව්‍යාපෘති සඳහා අමුද්‍රව්‍ය සපයන ලද්දේ ගණුදෙනුකරු විසිනි. එබැවින් එම වටිනාකම අඩුවන බැවින් අපේක්ෂිත පිරිවැටුම අඩුවී ඇත.

(ආ) වාත්තු හා දැව භාණ්ඩ නිෂ්පාදනය කරන ලද වැඩහල් සඳහා ප්‍රමාණවත් වැඩ ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සහ කලද තරගකාරිත්වය නිසා අපගේ මිල ගණන් වලට වඩා අඩු මිල ගණන් වෙනත් අයතන හා පුද්ගලයින් ඉදිරිපත් කිරීමෙන් අප ආයතනයට ඇණවුම් ලැබීම අඩු වූ බැවින් පිරිවැටුම අඩු වීමට හේතු විය.

(ඇ) උමා ඔය ව්‍යාපෘතිය යටතේ අලිකොට ආරු වාරිමාර්ග ජල පාලන දොරටු සාදා සවිකිරීම සහ ගපූර් ගොඩනැගිල්ලේ දැව අලුත්වැඩියා කටයුතු පිරිවැටුම ඉලක්ක කර තිබුනද එම ව්‍යාපෘති කරගෙන යාම පිලිබඳ පැහැදිලි උපදෙස් නොලැබීම හා එම වැඩ කටයුතු කරගෙන යාම ප්‍රමාද විම නිසා ඉලක්ක සපුරා ගැනීමට අපහසු විය.

*2.* කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම. පුරප්පාඩු ප්‍රමාණය පහත සඳහන් කර ඇත.

| | | |
|---|---|---|
| ඉංජිනේරුවරු | - | 02 |
| ගණකාධිකාරීවරු | - | 01 |
| පරිපාලන නිලධාරීන් | - | 01 |
| කළමණාකරණ සහකාර | - | 11 |
| සංවර්ධන සහකාර | - | 05 |
| පුහුණු කම්කරු | - | 74 |
| නුපුහුණු කම්කරු | - | 15 |
| එකතුව | | 108 |

මේ වන විටපුහුණු කම්කරු බඳවාගැනීමේ පරිපාටි සම්බන්ධව අවසන් තීරණ ගැනීමට නියමිතය.

*3.* 2015-12.31 දිනට රාජ්‍ය ආයතන වලින් 2013 හා 2014 වර්ෂයේ ලැබිය යුතු මුදල් නොලැබීම හා ප්‍රමාද වීම.

2013 - රු. 23,035,442.11

2014 - රු. 58,185,491.68

*4.* මෙම තත්වය වලක්වා ගැනීම හා ආයතනය ඵලදායි තත්වයට පත් කර ගැනීම සඳහා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල කටයුතු අවසන් කරමින් පවතින අතර කලමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

**5.** ආයතනික මට්ටමෙන් යහපත් මුල්‍ය පාලනය තුලින් වියදම් අඩුකර ගැනීමට කටයුතු කර ඇත.